## අ.පො.ස උසස් පෙළ

# දේශපාලන විද්‍යාව





## 2.4.3 බලපෑම් කණ්ඩායම්

## 2.4.3. බලපෑම් කණ්ඩායම්

- ඇමරිකානු හා යුරෝපීය දේශපාලන විද්‍යාවේ විශේෂයෙන් සාකච්ඡාවට බඳුන් විය.

| බලපෑම් කණ්ඩායම් | අභිලාෂ කණ්ඩායම් | ලොබි කණ්ඩායම් |
|---|---|---|
| කණ්ඩායමක් හැටියට සංවිධානය වී<br>• නීති<br>• රාජ්‍ය ප්‍රතිපත්ති<br>• රජයේ තීරණ<br>යන මේවාට බලපෑම් කරන සංවිධානාත්මක පුරවැසි කණ්ඩායම් ය. | • නිශ්චිත අභිලාෂයක්<br>• අරමුණක්<br>• ඵල ප්‍රයෝජනයක්<br>පදනම් කරගෙන තම සාමාජිකයින්ගේ උවමනා සහ අභිලාෂ ඉටුකරගැනීමට ක්‍රියා කරන සංවිධානාත්මක පුරවැසි කණ්ඩායම් ය. | නීතිය ,රාජ්‍ය ප්‍රතිපත්ති හා රජයේ තීරණ ආදියට බලපෑම් කිරීමට මහජන නියෝජිතයන්, දේශපාලනඥයන්, නිලධාරීන් හමුවෙමින්, ඔවුන්ගේ තීරණවලට තමන්ට අවශ්‍ය බලපෑම් සිදුකරන නැතහොත් වෙනත් සමාජ කණ්ඩායමක් හෝ ආණ්ඩුවක් හෝ වෙනුවෙන් මුදලට එම කාර්යය සිදුකරන සංවිධිත කණ්ඩායමය. ලොබි කණ්ඩායම් පුරවැසි කණ්ඩායම් විය හැකි අතර එසේ නොවීමට ද පුළුවන.<br>උදා:- ඇමරිකාවේ පුරවැසි කණ්ඩායම් හෝ විදේශ ආණ්ඩු හෝ වෙන්වෙන් ලොබි කණ්ඩායම් කරන, එමගින් ආදායම් උපයන ව්‍යාපාරික සමාගම් |

- මේවා ඇමරිකාවේ බහුලව භාවිතා වන්නේ **අභිලාෂ කණ්ඩායම්** **(Internet Groups )** **සහ ලොබි කණ්ඩායම්** **( Lobbing Groups )** යන පද දෙකයි. බ්‍රිතාන්‍යයේ භාවිතා කරන්නේ **බලපෑම් කණ්ඩායම්** යන්නයි


Copyright © e-thaksalawa.moe.gov.lk

**බලපෑම් , අභිලාෂ සහ ලොබි යන කණ්ඩායම් දේශපාලන විද්‍යා අධ්‍යයනයට වැදගත් වීමට හේතු**


- නීති සම්පාදනයට බලපෑම් කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති වලට බලපෑම් කිරීම.
- ආණ්ඩුවල තීරණ වලට බලපෑම් කිරීම.
- දේශපාලන පක්ෂ වලට අමතර ව සහ සමාන්තර ව පවතින ආයතන වීම.

❖ මේවා විධිමත් සංවිධාන වන අතර බටහිර රටවල මෙන් ම ලංකාවේ ද තිබෙන්නේ සමිති සමාගම් හැටියට ය. ඒවායේ සාමාජිකයෝ සහ නිලධාරී මණ්ඩල සිටිති.


- ව්‍යවස්ථා
- කාර්යාල
- වැටුප් ලබන කාර්ය මණ්ඩල සහිත ය.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# දියුණු කාර්මික ධනවාදි සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රටවල්





## කාර්මීකරණයට සහ නවීකරණයට අඩුවෙන් භාජනය වී





Copyright © e-thaksalawa.moe.gov.lk




## ශ්‍රී ලංකාවේ නිදසුන්

- සුළු තේ වතු හිමියන්ගේ සංගමය
- වැවිලි කරුවන්ගේ සංගමය
- ලංකා වානිජ මණ්ඩලය
- ලංකා මහිලා සමිතිය
- රාජ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ
- සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
- පෞද්ගලික බස්රථ හිමියන්ගේ සංගමය

දේශපාලන විද්‍යා සාහිත්‍යයේ දී

- වෘත්තීය සමිති
- සමාජ ව්‍යාපාර

බලපෑම් / අභිලාෂ / ලොබි කණ්ඩායම් ලෙස නොසැලකේ.

ඒවා වෙන ම ප්‍රභේදයක දේශපාලන ආයතන වේ.




Copyright © e-thaksalawa.moe.gov.lk

**දේශපාලන පක්ෂ සහ බලපෑම් කණ්ඩායම් අතර ඒවායේ අරමුණු දිනා ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් බලන විට ප්‍රධාන වෙනසක් තිබේ.**

I. දේශපාලන පක්ෂ ආණ්ඩු ඇතුළට ගොස් එමගින් රාජ්‍ය ප්‍රතිපත්ති තීරණ ආදියට බලපෑම් කිරීමට උත්සාහ දරති.

II. බලපෑම්/ අභිලාෂ/ ලොබි කණ්ඩායම්වල මූලෝපායය වන්නේ, ආණ්ඩු තුළට නොයා ආණ්ඩුවට පිටතින් සිට ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට හා තීරණවලට බලපෑම් කිරීම ය.

III. ඇතැම් බලපෑම් කණ්ඩායම් තනි තේමාවක් මත ගොඩනැගී තිබෙන සංවිධාන වේ.

උදා:-

- පරිසරය රැකීම.
- විශ්‍රාමිකයන්ගේ අයිතිවාසිකම් රැකීම.
- බස් මගීන්ගේ අයිතීන් සුරැකීම.
- නිර්යාත වෙළඳාමේ යෙදී සිටින සමාගම්වල අයිතීන් රැක ගැනීම.
- මරණ දඬුවමට විරුද්ධ වීම.

IV. ඇතැම් බලපෑම් කණ්ඩායම් ඊට වඩා පුළුල් නභය පත්‍ර හා ඉලක්ක සහිත ඒවා වේ.

උදා:-

- ප්‍රජාතන්ත්‍රවාදය
- මානව අයිතිවාසිකම්
- ස්ත්‍රී අයිතිවාසිකම් ආදී න්‍යාය පත්‍ර.


Copyright © e-thaksalawa.moe.gov.lk

# බලපෑම් / අභිලාෂ / ලොබි කණ්ඩායම් වලට පක්ෂ,විපක්ෂ තර්ක

| පක්ෂව ඇති තර්ක | විපක්ෂව ඇති තර්ක |
|---|---|
| 1. දේශපාලන පක්ෂ තම න්‍යාය පත්‍රයට ඇතුළත් කර නොගන්නා, එහෙත් නිශ්චිත පුරවැසි කණ්ඩායම්වලට අදාළ සහ වැදගත් වන දුක් ගැනිවිලි, ඉල්ලීම්, අභිලාෂ සහ අවශ්‍යතා පිළිබඳව සමාජයේත්, ආණ්ඩුවේත් අවධානය යොමු කිරීමේ මාධ්‍යයක් වීම. | මේවාට බැඳෙන්නෝත්, ක්‍රියාකාරකයන් වන්නෝත් උගත්, ධනවත් සහ වරප්‍රසාද ලත් පුරවැසියන් ය. එබැවින් මෙවැනි බල සංවිධාන බල ප්‍රභූත්ව (elite ) ගති ලක්ෂණයක් තිබෙන අතර ඒවායින් ප්‍රතිලාභ ලබන්නේ ද සමාජයේ ප්‍රභූ ස්තරයන් වීම. |
| 2. දේශපාලන පක්ෂවල ඌනපූරණයක් ලෙස ක්‍රියාකරමින් පුරවැසි දේශපාලන සහභාගීත්වයේ අවකාශය පුළුල් කිරීම. | මේවා නියෝජනය කරන්නේ සමාජ කණ්ඩායම්වල පටු සහ නිශ්චිත අවශ්‍යතා නිසා, ඒවායින් සමාජයේ වැඩි දෙනාගේ සහ පොදු යහපතට සිදුවන සේවාව පහළ මට්ටමක පැවතීම. |



e තක්සලාව
The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

| | |
|---|---|
| 3. රාජ්‍ය ප්‍රතිපත්ති හා තීරණ ගැන, උනන්දුව දක්වන පුරවැසියන් සංවිධානය කිරීමහා ඔවුන් අතර ඒ පිළිබද සාකච්ඡා සහ විවේචනය ප්‍රවර්ධනය කිරීම මගින් සමාජයේ මහජන දේශපාලන සාකච්ඡාව ගැඹුරු කිරීම හා ඒ මගින් ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම. | සමහර රටවල මෙවැනි කණ්ඩායම් වලට බොහෝ සමාජ බලයක් හිමි ය. එය වනාහි ජනතාව වෙතින් ලබන බලයක් නොවේ. එබැවින් ඒවා සතු බලය සුජාත භාවයකින් යුක්ත නොවීම. |
| 4.තම ප්‍රතිපත්ති හා තීරණ පිළිබද ව ආණ්ඩු දක්වන හිතුවක්කාර චර්යාවට සංවරණයක් ලෙස ක්‍රියා කරමින් සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී ශක්‍යතාව ශක්තිමත් කිරීම. | ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය විවෘත වූවක් වුවත්, මෙම සංවිධාන ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා තීරණ ආවෘත වූවක් බවට පත් කිරීම. |

i. දේශපාලන පක්ෂ උත්සාහ කරන්නේ දේශපාලන බලය ලබා ගැනීම මගින් ආණ්ඩු බලය ක්‍රියාත්මක කිරීමට ය.

ii. දේශපාලන පක්ෂ "සාමාජික කාඩ්පත" හිමි සාමාජිකයන්ගෙන් සමන්විතවන සංවිධානගත ඒකකයකි.

iii. ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට අදාළවන විෂයය ගණනාවක් අවධාරණය කරන ප්‍රතිපත්ති රාමුවක් පැවතීම. (සමහරවිට තනි ප්‍රතිපත්තිමය කරුණක් පමණක් ඉදිරියට දමන කුඩා පක්ෂ ද පවතී.)

iv. දේශපාලන පක්ෂයකට ප්‍රතිපත්තිමය සහ මතවාදී අනන්‍යතාවයක් පැවතීම.

- දක්ෂිණාංශික
- වාමාංශික


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

- මධ්‍යස්ථවාදී
- ජාතිකවාදී
- සුභ සාධනවාදී      ආදී ලෙස

**දේශපාලන පක්ෂ පිළිබඳ අධ්‍යයනයේ දී දේශපාලන විද්‍යාඥයින් උනන්දුව දක්වා ඇති තේමා පහත පරිදි වේ.**

- දේශපාලන පක්ෂවල කාර්යය
- දේශපාලන පක්ෂ වර්ගීකරණය
- දේශපාලන පක්ෂ ක්‍රම
- පක්ෂ ක්‍රියාකාරීත්වය හා උපක්‍රම



Copyright © e-thaksalawa.moe.gov.lk